ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය
இலங்கை கணினி அவசர தயார்நிலை அணி
Sri Lanka Computer Emergency Readiness Team

SRI LANKA CERT|CC

කාමර අංක. 4-112, බී.එම්.අයි.සී.එච්, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.
அறை இல. 4-112, பி.எம்.ஐ.ஸி.எச், பௌத்தாலோக மாவத்தை, கொழும்பு 07.
Room No. 4-112, BMICH, Bauddhaloka Mawatha, Colombo 07.

**Alert Classification: Critical**

## නිවේදනය | CYBER SECURITY ALERT

**<u>PHP මෘදුකාංගය භාවිතා කර නිර්මාණය කර ඇති පද්ධතිවල ඉතා අවදානම් සහගත ආරක්ෂක දුර්වලතා සම්බන්ධයෙන් කඩිනම් අවධානය යොමු කිරීම</u>**

වෙබ් අඩවි සහ වෙබ් යෙදුම් සංවර්ධනය සඳහා බහුලව භාවිතා වන PHP පරිගණක මෘදුකාංගයට අදාළව හඳුනාගෙන ඇති ආරක්ෂක දුර්වලතා සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සර්ට් ආයතනය, රාජ්‍ය හා පෞද්ගලික ආයතන සහ වෙබ් අඩවි නිර්මාණකරුවන්ගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටියි.

CVE-2026-109618 සහ CVE-2026-109619 යන හඳුනා ගැනීමේ කේත මගින් සඳහන් කර ඇති ආරක්ෂක දුර්වලතා හේතුවෙන්, පද්ධතිවලට අනවසරයෙන් ප්‍රවේශ වීම, දත්ත සොර ගැනීම්, ක්‍රියාකාරීත්වයට බාධා පැමිණවීමේ දැඩි අවදානමක් එල්ල වී ඇත.

මෙවන් තත්වයක් තුළ, අවදානම අවම කිරීම සඳහා පහත පියවර කඩිනමින් අනුගමනය කරන ලෙස ශ්‍රී ලංකා CERT ආයතනය අදාළ පාර්ශ්වයන්ගෙන් ඉල්ලා සිටී.

- PHP භාවිතා කරන සියලුම පද්ධති සහ වෙබ් යෙදුම් හඳුනාගෙන ඒවායේ ක්‍රියාත්මකවන අනුවාද පරීක්ෂා කිරීම (versions).
- ආරක්ෂක දෝෂ සඳහා නිකුත් කර PHP යාවත්කාලීන කිරීමේ මෘදුකාග (software patch) මගින් පද්ධති සහ වෙබ් යෙදුම් වහාම නිසි ක්‍රමවේදයකට අනුකූලව යාවත්කාලීන කිරීම. මේ සඳහා PHP නිල වෙබ් අඩවියෙන් ලබදී ඇති යාවත්කාලීන කිරීමේ උපදෙස් අනුගමනය කලයුතුය. (https://www.php.net)
- පද්ධතිවල ලොග් පරීක්ෂාකර අසාමාන්‍ය ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීම.
- යාවත්කාලීන කළ නොහැකි දැඩි අවදානම් සහගත පද්ධති වෙත ඇති අන්තර්ජාල ප්‍රවේශය සීමා කිරීම.

**ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (Sri Lanka CERT)**

**2026 ඔක්තෝබර් 21**

දුරකථන / தொலைபேசி / Telephone: 11-269 1692, 101 (Hot Line)
ෆැක්ස් / தொலைநகல் / Fax: 11-269 1064
ඊ-තැපැල / மின்னஞ்சல் / E-mail: info@cert.gov.lk
වෙබ් / இணையதளம் / Web: www.cert.gov.lk

https://lk.linkedin.com/company/sri-lanka-cert-cc https://www.facebook.com/CERT.lk/